# ඉතිහාසය

## අ.පො.ස. (උ/පෙළ)



Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

## ත්‍රිකෝණ අරගලයට සම්බන්ධ වූවෝ

- ගුර්ජර ප්‍රතිහාර - රාජ්පුතානා
- පාල - බෙංගාලය
- රාෂ්ටකූට - මාන්‍යඛේතය

## දකුණු ඉන්දීය රාජවංශ

- පල්ලව - කාංචිපුරම්
- චාලුක්‍ය - වාතාපිය, කල්‍යාණි, වෙංගි
- පාණ්ඩ්‍ය - මධුරාපුර
- මොවුන්ගේ ප්‍රභවය සම්බන්ධ තොරතුරු එතරම් පැහැදිලි නොමැති අතර බටහිර ඉන්දියාවට කඩා වැදුණු

## හර්ෂවර්ධන රජුගෙන් පසු කනෞජයේ බලය සඳහා ත්‍රෛපාක්ෂික අරගලයට සම්බන්ධ වූවෝ

### බටහිර ඉන්දියාවේ රාජ්පුතානාවේ ගුර්ජර ප්‍රතිහාරයන්

හූණයන් අතර ගුර්ජරයන් ද සිටින්නට ඇතැයි විශ්වාස කෙරේ.

- අරාබි ආක්‍රමණවලදී ඉන්දියාව රැකගැනීමට ගුර්ජරයන් විශාල මෙහෙයක් ඉටුකොට තිබේ.
- ගුර්ජරයන්ගේ ආරම්භක පාලකයා හරිචන්ද්‍ර බ්‍රාහ්මණ නමින් හඳුන්වන අතර ප්‍රථම වැදගත් පාලකයා ලෙස සැලකෙන්නේ පළමුවන නාගභටය (ක්‍රි.ව.730-756*. මොහුගේ ග්වෝලියෝර් ලිපියට අනුව මෙතුමා අරාබි ආක්‍රමණ පරාජයට පත්කොට ඇත.
- පළමුවන නාගභටගෙන් පසු රාජ්‍යත්වයට පත්වන්නේ වත්සරාජය. මොහු පිළිබඳ කුවාලයාමාලා, හරිවංසපුරාණය යන ග්‍රන්ථයන්හි දැක්වේ. මොහු රාෂ්ටකූට පාලක ධ්‍රැව අතින් පරාජයට පත් වී ඇත.
- වත්සරාජගෙන් පසු ඔහු පුත් දෙවන නාගභට ගුර්ජර බලය නැවත නගා සිටුවීමට කටයුතු කළේය. මොහුට තුන්වන ගෝවින්ද නම් රෂ්ටකූට රජුගේ ආක්‍රමණයන්ට මුහුණ දීමට සිදු විය. කනෞජයේ බලය සඳහා මෙතුමා පාල වංශික ධර්මපාල සමග සටන් කොට ඔහුව පරාජයට පත් කළේය.
- දෙවන නාගභටගේන් පසු රාමභද්‍ර ද, ඔහුගෙන් පසු එතුමාගේ පුත් මිහිරභෝජ ද රාජ්‍යත්වයට පත් විය. භෝජ රජු ගුර්ජර බලය නගාසිටුවීමට ක්‍රියා කළද ඔහුට රාෂ්ටකූටයන්ගේ, පාලයන්ගේ මෙන්ම කලචුරි රාජවංශයේ කොක්කල රජුගේද ආක්‍රමණවලට මුහුණ දීමට සිදු විය. කෙසේ වෙතත් තම බලය යළිත් ශක්තිමත් කරගත් භෝජ රජු පාල වංශික නාරායනපාල රජු පරාජයට පත් කරමින් එම ප්‍රදේශවල තම බලය තහවුරු කරගත්තේය. ඉන් අනතුරුව රාෂ්ටකූට පාලක දෙවන කෘෂ්ණ සමග සටන් කොට ජයගත් අතර එය තාවකාලික වූවක් විය. බුන්දෙල්කාන්හි චන්දෙල්ලවරන් ද භෝජ රජුගේ ආධිපත්‍ය පිළිගත් පිරිසක් විය. ඉන්දියානු සාහිත්‍යයේ ශ්‍රේෂ්ඨතම කවියෙකු වූ රාජශේඛර භෝජ රජුගේ ආචාර්යවරයා විය. එතුමා විසින් බාලරාමායනය, කර්පූර්මංජරී වැනි ග්‍රන්ථ රචනා කරන ලදි.

Copyright © www.e-thaksalawa.moe.gov.lk


Copyright © www.e-thaksalawa.moe.gov.lk



- භෝජ රජුගෙන් පසු ඔහු පුත් මහේන්ද්‍රපාල හෙවත් මහේන්ද්‍රායුධ බලයට පත් විය. ගුර්ජර බලය සැලකියයුතු ප්‍රදේශයක ව්‍යාප්ත කිරීමට මොහු සමත් විය.

- මහේන්ද්‍රපාල රජුගෙන් පසු ගුර්ජර වංශයේ බලයට පත් වැදගත් පාලකයා ලෙස සැලකෙන්නේ මහීපාල හෙවත් විනායකපාල රජුය. ගුර්ජර රාජසභා කවියෙකු වූ රාජශේඛර මොහු පිළිබඳ වර්ණනා කර ඇති අතර මෙතුමා ගුර්ජර බලය ව්‍යාප්ත කරමින් රාෂ්ටකූටයන් ට අයත් ප්‍රදේශවල පවා තම බය ව්‍යාප්ත කර ඇත.

- මහීපාල රජුගෙන් පසු දෙවන මහේන්ද්‍රපාල, දේවපාල, දෙවන විනායකපාල, දෙවන මහීපාල හා විජයපාල යන පාලකයන් බලයට පත් වූ අතර ගුර්ජරයන්ගේ අවසන් පාලකයා ලෙස සැලකෙන්නේ ත්‍රිලෝචනපාල රජුය. මෙකල සඡ්නි මහමුද්ගේ ආක්‍රමණ හමුවේ ප්‍රතිහාර වංශය මුළුමනින්ම විනාශයට පත් විය.

## ගුර්ජර-ප්‍රතිහාර රජවරු

1. හරිචන්ද්‍ර බ්‍රහ්මණ
2. පළමුවන නාගභටය
3. කක්කුක
4. වත්සරාජය/දේවරජ
5. දෙවන නාගභට
6. රාමභද්‍ර
7. මිහිරභෝජ
8. මහේන්ද්‍රපාල
9. II භෝජ
10. මහීපාල හෙවත් විනායකපාල
11. දෙවන මහේන්ද්‍රපාල
12. දේවපාල
13. දෙවන විනායකපාල
14. දෙවන මහීපාල
15. විජයපාල
16. රාජ්‍යපාල
17. ත්‍රිලෝචනපාල
18. යශපාල

## බෙංගාලයේ පාලවරු

- සසාංකගෙන් පසු බෙංගාලයේ බලය තහවුරුකර ගත් පාල රාජවංශයේ ආරම්භකයා ලෙස සැලකෙන්නේ ගෝපාල රජු (750-770) වන අතර මේ වංශයෙන් සියලුම පාලකයෝ බෞද්ධයෝ වෙති.
- ගෝපාල රජුගෙන් පසු රාජ්‍යත්වයට පත් වන්නේ ධර්මපාල රජුය (ක්‍රි.ව. 770-810). මෙතුමා පිළිබඳ තොරතුර මෙතුමාගේ කාලිම්පූර් තඹ සන්නසේ සඳහන් වේ. මොහුට ආරම්භයේ සිටම ගුර්ජරයන් සමග මෙන්ම රාෂ්ටකූටයන් සමකග ගැටීමට සිදු විය. මෙහිදී ගුර්ජරයන් පරාජයට පත් කළ ධර්මපාල රජු කනෞජය ආක්‍රමණය කොට ගුර්ජරයන්ට යටත්ව සිට ඉන්ද්‍රායුධ කුමරු ඉවත් කොට ඒ වෙනුවට චක්‍රායුධ කනෞජ සිහසුනට පත් කිරීමට සමත් විය. ගුජරාටි කාව්‍යයක් වන උදයාන සුන්දරි කථා නම් ග්‍රන්ථයේ ධර්මපාල රජු උත්තරාපථ ස්වාමීන් යනුවෙන් හඳුන්වා ඇත. රාෂ්ටකූට පාලකයෙකු වූ තුංගගේ දියණියක වූ රත්නාදේවී විවාහ කරගැනීම නිසා පාල බලය ශක්තිමත් වී ඇත.

අන්තර්ගතය සකස් කිරීම : කේ. ගයාන් සිසිර කුමාර මයා - ශ්‍රී ලං.ගු.සේ. II - ර/එරත්න මහා විද්‍යාලය, එරත්න, කුරුවිට
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස තුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

⇒ වික්‍රමශිලා හා ඕදන්තපුර් විශ්වවිද්‍යාල ධර්මපාල රජුගේ නිර්මාණයක් ලෙස සැලකේ.

⇒ සෝමපුර් විහාරය ඇතුළු බෞද්ධ ආයතන 50ට අධික ප්‍රමාණයක් මෙතුමා නිර්මාණය කර ඇත.

⇒ සුප්‍රකට බෞද්ධ පඬිවරයෙකු වූ හරිභද්‍ර මෙතුමාගේ කාලයේ සිටි අයෙකි.

- ධර්මපාලගෙන් පසු ඔහු පුත් දේවපාල රජ විය. දේවපාල තමන්ට සමකාලීන ගුර්ජර පාලකයන් වූ වත්සරාජ, දෙවන නාගභට හා භෝජ සමග සටන් කොට ජයග්‍රහණ අත් කරගැනීමට සමත් වී ඇත. පාණ්ඩ්‍ය අධිරාජ්‍යයා වූ ශ්‍රීමාරශ්‍රීවල්ලභ රජුව පරාජයට පත් කිරීමට ද දේවපාල රජු සමත් වන්නට ඇතැයි විශ්වාසයක් පවතියි. මෙතුමා බෞද්ධ රාජ්‍යයක් වූ සුමාත්‍රාවේ ශෛලේන්ද්‍ර රාජවංශය සමග පවා සබඳතා ඇති කරගන්නට ඇතැයි විශ්වාස කෙරේ.
- දේවපාල රජුගෙන් පසු ව්‍යාග්‍රපාල හෙවත් විග්‍රහපාල බලයට පත් වන අතර ඉන්පසු ඔහු පුත් නාරයන්පාල රජ වේ. මේ අවධියේ පාල රාජවංශයේ පරිහානිය ආරම්භ වේ.
- නාරයනපාලගෙන් පසු ඔහු පුත් රාජ්‍යපාල රජවන අතර ඉන් පසු දෙවන ගෝපාල, දෙවන ව්‍යාග්‍රපාල යන පාලකයන් බලයට පත් වේ.
- පාලවරුන්ගේ රාජ්‍ය බිඳ වැටීටමෙන් පසු එම ප්‍රදේශවල කාම්බෝජ හා හරිකේල යන රාජ්‍යයන් දෙක බලයට පත් වේ.

## පාල රජවරු

1. ගෝපාල
2. ධර්මපාල
3. දේවපාල
4. ව්‍යාග්‍රපාල හෙවත් විග්‍රහපාල
5. නාරයනපාල
6. රාජ්‍යපාල
7. දෙවන ගෝපාල
8. දෙවන විග්‍රහපාල
9. මහීපාල

- හර්ෂ රාජ්‍ය කාලයෙන් පසු (ගුර්ජර, පාල) රචනා වූ ග්‍රන්ථ කිහිපයකි.

1. තාරකා විද්‍යාඥ භාස්කරාචාර්ය - සිද්ධාන්ත ශිරෝමණී
2. විද්‍යාඥ ශරිදරී - ත්‍රිශති
3. බිල්හාණගේ - වික්‍රමදේවචරිත (චරිත කතා)
4. හල්ලාලගේ - භෝජ ප්‍රබන්ධය (චරිත කතා)
5. චන්ද හර්දෝයිගේ - පෘථිවිරාජරාසො (චරිත කතා)

* මේ අවධියේ ගෘහනිර්මාණය ද දියුණුව පැවතිණ.

1. ගන්ධ චන්දෙල්ලා රජුගේ බුන්දෙල්කාන්ද්හි කන්දරිය මහා දේවාලය විශිෂ්ට එකකි.
2. අබුකන්දේ දිල්වර දේවාලය
3. ගුජරාටයේ ලූනාවාසහි වස්තුපාල හා තේජපාල ජෛන ආරාම
4. භුවනේශ්වර්හි ලිංගරාජ දේවාලය හා ජගන්නාථ දේවාලය (ඔරිස්සා ගෘහනිර්මාණ ශිල්පියට අයත් වේ).

අන්තර්ගතය සකස් කිරීම : කේ. ගයාන් සිසිර කුමාර මයා - ශ්‍රී ලං.ගු.සේ. II - ර/එරත්න මහා විද්‍යාලය, එරත්න, කුරුවිට
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස කුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## රාෂ්ටකූටයෝ - මාන්‍යකේතය

- ඩෙකානයේ ප්‍රබල බලයක් ගොඩනගාගෙන සිටි රාෂ්ටකූටයන් මුල්කාලයේ චාලූක්‍යයන් යටතේ සිට ඇති අතර මොවුන්ගේ ආරම්භකයා ලෙස සැලකෙන්නේ දන්තිදුර්ගය. චාලූක්‍යයන් පරාජය කරමින් මහාරාෂ්ට්‍ර ප්‍රදේශය පැහැරගත් දන්තිදුර්ග මාල්වාහි ගුර්ජරයන් පරදවා හිරණ්‍යගර්භදාන නම් යාගයක් ද පවත්වා ඇත. දෙවන නන්දිවර්මන් පල්ලව රජුට තම දියණියක විවාහ කර දී බලය ශක්මත් කරගත් මොහු මහාරාජාධිරාජ, පරමේශ්වර, පරම භට්ටාරක වැනි විරුද භාවිත කළේය.

- දන්තිදුර්ගගෙන් පසු පළමුවන ක්‍රිෂ්ණ රජු බලයට පත් වූ අතර ඔහු චාලූක්‍ය වංශය සම්පූර්ණයෙන් විනාශ කර දැමීය. මොහු මයිසෝරයේ ගංගයන් ද පරාජය කර ඇත.

- ක්‍රිෂ්ණගෙන් පසු ඔහු පුත් දෙවන ගෝවින්ද බලයට පත් වූ අතර ඔහු තම රාජ්‍ය පාලන කටයුතු සොයුරු ධ්‍රැවට ලබා දුන්නේය. ධ්‍රැව විසින් විනෝදකාමී දෙවන ගෝවින්ද බලයෙන් පහකොට රජ වූ අතර වෙංගි හා පල්ලව පාලකයන්ට විරුද්ධව සටන් මෙහෙයවා රය ලැබීමට ඔහු සමත් විය. රාෂ්ටකූටයන් ත්‍රිකෝණ අරගලයට සම්බන්ධ වූයේ මේ අවධියේය.

- ධ්‍රැව රජුගෙන් පසු ඔහුගේ පුතුන් සිව් දෙනා අතුරින් ගෝවින්ද කුමරු තුන්වන ගෝවින්ද (ජගත්තුංග) නමින් රජ විය. රාෂ්ටකූටයන්ගේ බල ව්‍යාප්තියේ උච්චතම අවස්ථාව මෙතුමාගේ අවධියේ නිර්මාණය වූ බව විශ්වාස කෙරේ. ඒ අනුව පල්ලවයන්ගේ කාංචි පුරය ජයගත් ගෝවින්ද රජු ගුර්ජරයන් පරදවා ගංගා-යමුනා කලාපයට තම බලය ව්‍යාප්ත කළ අතර තවද ගංග, පාණ්ඩ්‍ය හා කේරළ යන රාජ්‍යවල පාලකයන්ද පරාජයට පත් කළේය.

- තුන්වන ගෝවින්ද රජුගෙන් පසු ඔහු පුත් අමෝඝවර්ෂ රජු බලයට පත් වූ අතර රාෂ්ටකූටයන්ගේ ස්ථිර පාලන මධ්‍යස්ථානය මාන්‍යකේතය බවට පත්කරගන්නේ මෙතුමාය.

- අමෝඝවර්ෂ රජුගෙන් පසු රාජ්‍යත්වයට පත් වූයේ දෙවන ක්‍රිෂ්ණ රජුය. මොහු ලාට හා ගෞඩ පාලකයන්ගේ මානය බිඳ දමා අංග, මගධ හා කාලිංග ප්‍රදේශයන්හි බලයට පිහිටවීය. මෙතුමා චෝළ දේශය ආක්‍රමණය කළද වෙල්ලාල නම් ස්ථානයේ කළ සටනින් පරාජයට පත් වී ඇත.

- දෙවන ක්‍රිෂ්ණ රජුගෙන් පසු තුන්වන ඉන්ද්‍ර රජු බලයට පත් වූ අතර ගුර්ජර පාලකයන් පරාජයට පත් කරමින් කනෞජය අත්පත් කරගැනීමට ද සමත් විය.

- තුන්වන ඉන්ද්‍රගෙන් පසු ඔහු පුත් දෙවන අමෝඝවර්ෂ රජු බලයට පත් වූ අතර ඔහුගෙන් පසු සිව්වන ගෝවින්ද, තුන්වන අමෝඝවර්ෂ යන පාලකයන් බලයට පත් විය.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය සකස් කිරීම : කේ. ගයාන් සිසිර කුමාර මයා - ශ්‍රී ලං.ගු.සේ. II - ර/එරත්න මහා විද්‍යාලය, එරත්න, කුරුවිට
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස තුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල

Copyright © www.e-thaksalawa.moe.gov.lk

- අමෝඝවර්ෂ රජුගෙන් පසු බලයට පත් වූයේ ඔහු පුත් තුන්වන ක්‍රිෂ්ණ කුමරුය. ගුර්ජර පාලකයන් සමග සටන් වැදී ඔවුන් පරාජයට පත් කළ මොහු දකුණු දිග ප්‍රදේශයට ආක්‍රමණ දියත් කර කාංචිය හා තංජෝරයද ආක්‍රමණය කිරීමට සමත් විය. තක්කෝලම්හී දී චෝළ රජුද මරණයට පත් කිරීමට සමත් වූ මොහු හතරවන මිහිඳු රාජ්‍ය කාලයේදී ලක්දිව ඌරාතොටට එල්ල කළ බවට ද විශ්වාස කෙරේ. ඒ අනුව රාෂ්ටකූට වංශයේ අවසන් ශ්‍රේෂ්ඨ රජු ලෙස මොහු සැලකේ.

- මින් පසු ඛොට්ටිග නම් ක්‍රිෂ්ණ රජුගේ බාල සොහොයුරු බලයට පත් වන අතර මේ අවධියේ රාෂ්ටකූට බලය පිරිහීමට ලක් වන අතර ඛොට්ටිගගෙන් පසු රජ වූ දෙවන කර්ක රජ විය. පස්වන අමෝඝවර්ෂගෙන් පසු රාෂ්ටකූට බලය සම්පූර්ණයෙන් අවසන් විය.

* රාෂ්ටකූටයන් යටතේ ජෛනාගම හා හින්දු දහම දියුණු වූ අතර බුදුදහම පරිහානියට පත් විය. රාෂ්ටකූටයන් යටතේ කණ්ණඩ හෙවත් කර්ණාට සාහිත්‍ය වර්ධනය විය.

* මෙකල සිටි පඬිවරුන් අමෝඝවර්ෂ රජු, සකස්‍යායන, ගුණවර්මන්, විමලෝදය, නාගර්ජුන, ජයබන්ධු, දුර්විනීත

⇒ කවිරාජමාර්ගය - අමෝඝවර්ෂ රජු

⇒ ශබ්දානුශාසන - සකස්‍යායන

⇒ අමෝඝවුත්ත - සකස්‍යායන

* එල්ලෝරාවේ කෛලාස දේවාලය මෙකල ගෘහනිර්මාණ ශිල්පයේ හා මූර්ති ශිල්පයේ විශිෂ්ටත්වය පෙන්වන්නකි.

## රාෂ්ටකූට රජවරු

1. දන්තිදුර්ගය.
2. පළමුවන ක්‍රිෂ්ණ
3. දෙවන ගෝවින්ද
4. ධ්‍රැව
5. තුන්වන ගෝවින්ද (ජගත්තුංග)
6. අමෝඝවර්ෂ
7. දෙවන ක්‍රිෂ්ණ
8. තුන්වන ඉන්ද්‍ර
9. දෙවන අමෝඝවර්ෂ
10. සිව්වන ගෝවින්ද
11. තුන්වන අමෝඝවර්ෂ
12. තුන්වන ක්‍රිෂ්ණ
13. ඛොට්ටිග
14. කර්ක

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය සකස් කිරීම : කේ. ගයාන් සිසිර කුමාර මයා - ශ්‍රී ලං.ගු.සේ. II - ර/එරත්න මහා විද්‍යාලය, එරත්න, කුරුවිට
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස කුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## දකුණු ඉන්දීය රාජවංශ

### පල්ලව රාජවංශය - කාංචිපුරම්

#### දේශපාලනය

- ක්‍රි.ව. 3-4 සියවස් අතර දී පමණ කාංචිය අගනුවර කරගනිමින් බිහිවූ රාජවංශයකි. ප්‍රභවය පිළිබඳ මත කිහිපයකි.

1. පල්ලවයන් යනු සාතවාහන රජුන් යටතේ ඩෙකානයේ ප්‍රාදේශීය පාලකයන් ලෙස සිට සාතවාහන බලය පිරිහීමත් සමග ස්වාධීන වූ නාගගෝත්‍රික පිරිසකි. (කෘෂ්ණස්වාමි අයියන්ගර්)
2. රුද්‍රදාමන්ගේ ජුනාගාඩ් ලිපියේ පහ්ලවයන් පිළිබඳ සඳහන් අතර පහ්ලව හා පල්ලව යනු එකම පිරිසක් බවටද අනුමානයක් ඇත. ඒ අනුව පල්ලවයන් ශක ක්‍ෂත්‍රපයන් යටතේ ද සිටි පිරිසකි.
3. පල්ලව සංස්කෘතියේ ද්‍රවිඩ සංස්කෘතික ලක්‍ෂණවලට වඩා උතුරු ඉන්දියානු සංස්කෘතික ලක්‍ෂණ ඇති බැවින් ඔවුන් උතුරු ඉන්දියානු සම්භවයක් ඇති බවට ද මතයක් ඇත.

- පල්ලවයන්ගේ ආරම්භකයා බප්පදේව නැමැත්තෙකු ලෙස හඳුනාගන්නා අතර මහාරාජාධිරාජ විරුදය දැරූ මෙම වංශයේ පළමු වැන්නා ලෙස ශිව ස්කන්දවර්මන් රජු හැඳින් වේ. මොහුගෙන් පසු පල්ලව රජෙකු ලෙස සැලකෙන අලහබාද් ප්‍රශස්තියේ සඳහන් කාංචියේ විෂ්ණුගෝප රජ වූ බව සැලකේ. ක්‍රි.ව. 6 වන සියවසේ සිංහවිෂ්ණු නම් පාලකයාගේ අවධියේ සිට පල්ලව රාජවංශය පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු ලැබේ. ආරම්භයේ සිටම පල්ලවයන් චාලුක්‍ය හා පාණ්ඩ්‍යයන් සමග සටන් කොට ඇත. සිංහ විෂ්ණු දක්‍ෂිණාපථයේ විශාල ප්‍රදේශයක බලය ව්‍යාප්ත කර ඇත.

### මහේන්ද්‍රවර්මන්

- සිංහවිෂ්ණුගෙන් පසු බලයට පත් පල්ලව වංශයේ ප්‍රථම වැදගත් පාලකයා ලෙස සැලකෙන මහේන්ද්‍රවර්මන් රජු මත්තවිලාහ, විචිත්‍රචිත්ත, ගුණභර වැනි විරුද භාවිත කොට ඇත.
- මොහු චාලුක්‍ය වංශික ප්‍රබල දෙවන පුලකේශීන් සමග සටන් කළ අතර පළමුව පැරදී දෙවනුව ජයග්‍රහණය කළද පුලකේශීන් පල්ලව රාජ්‍ය උතුරු කොටසක් අල්ලා ගැනීමට සමත් විය.
- පර්වත හාරා දේවාල තැනීමේ සම්ප්‍රදාය හඳුන්වා දුන්නේ මොහු බවට සැලකේ.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

## පළමුවන නරසිංහ වර්මන් (මහාමල්ල)

- පල්ලව වංශයේ ශ්‍රේෂ්ඨතම පාලකයා වූ මොහු මනිමංගලම් නම් ස්ථානයක දී දරුණු සටනකින් පසු දෙවන පුලකේශීන් පරාජයට පත් කළේය. මෙම සටන සඳහා ආරක්ෂාව පතා ශ්‍රී ලංකාවෙන් ගිය මාන නම් කුමාරයෙකු ද මේ සටන් සඳහා සහභාගී වී ඇත. (මොහු මානවම්ම රජු ලෙස හඳුනාගෙන තිබේ.)
- ඉන් පසු චාලුක්‍යාන්ගේ වාතාපිය ද ආක්‍රමණය කළ නරසිංහවර්මන් ඉන් ජය ලැබූ බව මල්ලිකාර්ජුනදේව කෝවිල් ලිපියේ සඳහන් වේ. වාතාපිකොණ්ඩ යන විරුදය භාවිත කොට ඇත්තේ ඉන් පසුවයි. මෙම ජයග්‍රහණයෙන් පසු ඔහු විශිෂ්ටතම සටන්කරු නම් තේරුම දෙන මහාමල්ල හෙවත් මාමල්ල නම් විරුදයද භාවිත කළ අතර එම විරුදයට ගැලපෙන මාමල්ලපුරම් හෙවත් මහාබලිපුරම් නම් සුවිසල් නගරය ද කරවීය.
- හියුංත්සාං හිමි මේ අවධියේ කාංචියට පැමිණ තිබේ.
- නමුත් මොහුගේ අවසන් කාලයේදී දෙවන පුලකේශීන්ගේ පුත් පළමුවන වික්‍රමාදිත්‍ය අතින් පල්ලවයන් දරුණු ලෙස පරාජයට පත් විය.
- මොහුගෙන් පසු රාජ්‍යත්වයට පත් දෙවන මහේන්ද්‍රවර්මන් හා පළමුවන පරමේශ්වර්මන් යන පාලකයන්ගෙ කාලයේ චාලුක්‍ය තර්ජන නිසා පල්ලව බලය බෙහෙවින් පිරිහිණ.

## දෙවන නරසිංහවර්මන්

- පරමේශ්වර්මන්ගේ පුත්‍රයා වූ මොහු පල්ලව රාජ්‍ය මදක් ස්ථාවර තත්වයකට ගෙන ඒමට සමත් විය.
- කොංජිවරම්හි කෛලාසනාථ දේවාලය මෙකල ඉදිවූවකි.
- චලුක්‍යයන් ගංගයන්ගේ ද සහය ලබා පල්ලවයන් ට පහර දි දෙවන නරසිංහවර්මන් රජු මරණයට පත් කළ අතර එතැන් පටන් පල්ලවයන්ගේ පරිහානිය ආරම්භ වේ.

* දෙවන නරසිංහවර්මන් රජුගෙන් පසු දෙවන පරමේශ්වර්මන් බලයට පත් වන අතර ඔහු සිංහවිෂ්ණු පරපුරේ අවසන් පාලකයා වේ.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

## පල්ලව ශාඛා පෙළපත

- මෙම පෙළපතේ ප්‍රථම වැදගත් පාලකයා ලෙස සැලකෙන්නේ දෙවන නන්දිවර්මන් රජුය.

- මොහුට පාණ්ඩ්‍ය, චාලුක්‍ය ආක්‍රමණ වලට මෙන්ම චාලුක්‍ය බලය පරාජය කර ඩෙකානයෙ බලවත් වූ රාෂ්ටකූට ආක්‍රමණයන්ට ද මුහුණ දීමට සිදු විය.

- දෙවන නන්දිවර්මන් රජුගෙන් පසු බලයට පත් වන්නේ දන්තිවර්මන් රජුය. මොහුගේ අවධියේ රාෂ්ටකූය ආක්‍රමණ හා පාණ්ඩ්‍ය ආක්‍රමණ පල්ලව රාජ්‍යයට එල්ල විය. දන්තිවර්මන් රජුගෙන් පසු බලයට පත් තුන්වන නන්දිවරමන් රජු පාණ්ඩ්‍ය පාලක ශ්‍රී මාර ශ්‍රී වල්ලභ රජුගේ ආක්‍රමණ පරාජය කිරීමට සමත් වී ඇත. තුන්වන නන්දිවර්මන් රජු ගංගයන්, චෝළයන් හා රාෂ්ටකූටයන් සමග මිතුරු වී පාණ්ඩ්‍යන්ට පහර දී ඇත. මොහුගෙන් පසු බලයට පත් ඔහුගේ පුත් නෘපතුංගවර්මන් රජු පාණ්ඩ්‍යන් දරුණු ලෙස පරාජය කිරීමට සමත් වී ඇත.

- නෘපතුංගවර්මන් රජුගෙන් පසු බලයට පත් අපරාජිත වර්මන් රජු, ශ්‍රීපුරම්බියම් නම් සුප්‍රසිද්ධ සංග්‍රාමයේ දී දෙවන වරගුණවර්මන් නම් පාණ්ඩ්‍ය පාලකයා(ශ්‍රීමාරශ්‍රී වල්ලභ රජගේ පුත්) පරාජයට පත් කිරීමට සමත් වී ඇත. මෙසේ ජයග්‍රහණය ලැබුවද මෙයින් පල්ලව බලය බෙහෙවින් දුර්වල විය. එයින් ප්‍රයෝජනය ගත් චෝළ පාලක ආදිත්‍ය නැමැත්තා බිඳ වැටුණු පල්ලව රාජ්‍යයේ දකුණු ප්‍රදේශ අල්ලා ගනිමින් චෝළ රාජ්‍යටය පදනම දැමීය.

- පල්ලවයන් මුල්කාලයේ ආගමික සහනශීලී පාලකයන් වී ඇති අතර ජෛන, බෞද්ධ, ශිව හ වෛෂ්ණව ආගම් පැවත ඇත. නමුත් පසුව හින්දු දහම පමණක් අනුග්‍රහය දක්වා ඇත.

- මේ අවධියේ පර්වත කඨ දේවාල (පර්වත හාර හදන දේවාල), රථ දේවාල, මණ්ඩප දේවාල ආදි විශිෂ්ට ගෘහනිර්මාණ අංගයන් දක්නට ලැබේ. මෙම දේවාල ගලින් නිම වුවද දැවයෙන් නිම කළා සේ ඉතා සියුම් අංගයන් ද ඇතුළත් කර ඇත. චෝළ ගෘහ නිර්මාණයන්ට පල්ලව ආභාසය ලැබී ඇත.

- සංස්කෘත භාෂාව මෙකල ප්‍රචලිත වූ අතර ඔවුන්ගේ අක්ෂර ක්‍රමය පල්ලව ග්‍රන්ථාක්ෂර නමින් හැඳින් වේ.

- යම් තරමක සාහිත්‍ය දියුණුවක් ද මෙකල සිදු වී ඇත. පළමුවන මහේන්ද්‍රවර්මන් රජු මත්තවිලාශ ප්‍රහසන, දක්ෂිණ චිත නම් ග්‍රන්ථයන් රචනා කර ඇත. භගවත්ජුන නම් ග්‍රන්ථය ද ඔහුගේ බවට මතයක් ඇත.

- දෙවන නරසිංහවර්මන් රජුගේ රාජ සභාවේ සිටි දන්ඩින් සුප්‍රසිද්ධ සංස්කෘත පඬිවරයෙකි. ඔහු විසින් දශකුමාර චරිතය, කාව්‍යාදර්ශය නම් ග්‍රන්ථයන් රචනා කොට ඇත. ලක්දිව ලියැවුණු සියබස්ලකර කාව්‍යාදර්ශය ඇසුරින් ලියවූවක් යැයි විශ්වාස කෙරේ.

- නාලාරිය ප්‍රබන්ධම් නම් ග්‍රන්ථයක් ද මෙකල රචනා වී ඇත.

copyright © www.e-thaksalawa.moe.gov.lk


Copyright © www.e-thaksalawa.moe.gov.lk

## පල්ලව රජවරුන්

1. බප්පදේව
2. දේවවර්මන්
3. ශිව ස්කන්දවර්මන්
4. කාංචියේ විෂ්ණුගෝප
5. සිංහවිෂ්ණු
6. මහේන්ද්‍රවර්මන්
7. පළමුවන නරසිංහ වර්මන් (මහාමල්ල)
8. දෙවන මහේන්ද්‍රවර්මන්
9. පළමුවන පරමේශ්වර්මන්
10. දෙවන නරසිංහවර්මන්
11. දෙවන පරමේශ්වරවර්මන්
12. දෙවන නන්දිවර්මන්
13. දන්තිවර්මන්
14. තුන්වන නන්දිවරමන්
15. නෘපතුංගවර්මන්
16. අපරාජිත වර්මන්

## චාලුක්‍ය රාජවංශය

- උතුරින් නර්මදා නදිය හා වින්ධ්‍ය කඳු වැටියත්, දකුණින් ක්‍රිෂ්ණා තුංගභද්‍රා නදීන්ගෙන් සීමා වූ භූමි භාගය ඩෙකානය නමින් හැඳින්වේ. මෞර්යන්ගේ බලය පිරිහීමත් සමග ඩෙකානයේ බලය ගොඩනගාගත් සාතවාහනයන්ගෙන් පසු කුඩා කුඩා රාජධානි රැසක් ඩෙකානය තුළ බලය ගොඩනගාගනු දක්නට ලැබේ. ඒ අතර

  ⇒ කාංචිපුර - පල්ලවයන්

  ⇒ කානරයේ - කදම්බයන්

  ⇒ මයිසෝරයේ - ගංගයන්

- ආදි රාජවංශ වැදගත් වේ. පස්වන සියවස අවසානයේ දී පමණ මොවුන්ගේ බලය අභිබවා වාකාටක වංශය බලයට පත්වන අතර වාකාටයකයන්ගේ බලය පිරිහීමත් සමග චාලුක්‍ය නම් රාජවංශයක් බලයට පත් වේ. චාලුක්‍යයන් ප්‍රධාන වශයෙන් බටහිර චාලුක්‍ය හා නැගෙනහිර චාලුකය වශයෙන් කොටස් දෙකක් හඳුනාගත් හැකි අතර මෙයින් බටහිර චාලුක්‍ය වංශය තුළ වාතාපිය හෙවත් බදාමිය මුල්කරගත් චාලුක්‍ය වංශයක් හා කල්‍යාණිය මුල් කරගත් චාලුක්‍ය වංශයක් ද යනුවෙන් කණ්ඩායම් දෙකක් දක්නට ලැබේ. ඊට පසුකාලයේදී එනම් 07වන සියවසේදී පමණ වෙංගිය මුල් කරගනිමින් තවත් චාලුක්‍ය වංශයක් බලයට පත් වන ආකාරයක් දක්නට ලැබේ.


Copyright © www.e-thaksalawa.moe.gov.lk



## බටහිර චාලුක්‍ය - වාතාපිය (බදාමිය)

- අභිලේඛන සාධක අනුව චාලුක්‍ය වංශයේ ආරම්භකයන් ලෙස සැලකෙන්නේ පළමුවන ජයසිංහ හා රණරාගය.
- නමුත් ප්‍රථම ස්වාධීන පාලකයා ලෙස සැලකෙන්නේ රණරාගගේ පුත් පළමුවන පුලකේශීන්ය (ක්‍රි.ව.543-566). බදාමිය අගනුවර කරගනිමින් චාලුක්‍ය බලය ව්‍යාප්ත කළ මොහු පිළිබඳ අයිහෝල් ලිපියේ තොරතුරු දැක්වේ.
- පළමුවන පුලකේශීන් ඇවෑමෙන් ඔහු පුත් පළමුවන කීර්තිවර්මන් රජවූ අතර ඉන් පසු ඔහුගේ සොහොයුරු මංගලේශ පාලනය ගෙන ගියේ කීර්තිවර්මන්ගේ පුත්‍රයා ළබාල වියේ සිටි බැවිනි.
- මංගලේශ තම පුත්‍රයාට රජකම දීමට සූදානම් වන විට එයට විරුද්ධ වූ කීර්තිවර්මන් පුත් පුලකේශීන් ඔහුව ඝාතනය කොට දෙවන පුලකේශීන් නමින් රජ විය. චාලුක්‍ය වංශයේ ශ්‍රේෂ්ඨතම රජු ලෙස සැලකෙන්නේ දෙවන පුලකේශීන් ය. ඒ අනුව ඒවන විට ඩෙකානයේ ඒ ඒ තැන ස්වාධීනව සිටි කදම්බයන්, ගංගයන් ආදි ප්‍රාදේශීය පාලනයන් තමන් යටතට පත් කිරීමට ඔහු සමත් විය. කනෞජය කේන්ද්‍රකර ගනිමින් ප්‍රබල බලයක් ගොඩනාගාගෙන සිටි හර්ෂවර්ධන වින්ධ්‍යා කඳුකරයෙන් දකුණට තම දිග් විජය ව්‍යාප්ත කිරීමට උත්සාහ ගත් අවස්ථාවේ එය සම්පූර්ණයෙන් පරාජය කිරීමට දෙවන පුලකේශීන් සමත් වී ඇත. ඒ බව ඔහුගේ අයිහෝල් ලිපියේ දැක්වෙන අතර එම ජයග්‍රහණයෙන් පසු පුලකේශීන් පරමේශ්වර නම් විරුදය භාවිත කොට ඇත. බටහිර ඩෙකානයේ බලය තහවුරු කරගැනීමෙන් පසු නැගෙනහිර ඩෙකානයට තම අවධානය යොමු කළ පුලකේශීන් කාලිංගය, දකුණු කෝසලය, වර්තමාන ගන්ජම්, විසාගපටම්, පිෂ්ටපුරය හා වෙංගිය ද යටත්කර ගත්තේය. ඉන් පසු මේ වන විට දකුණු ප්‍රදේශයේ ප්‍රබල බලයක් ගොඩනගා ගෙන සිටි පල්ලව පාලක පළමුවන මහේන්ද්‍රවර්මන් රජු පරාජය කිරීමට දෙවන පුලකේශීන් සමත් විය. මෙකල බදාමියට වැඩම කළ හියුංත්සාං හිමියන්ද මේ රාජ්‍ය පිළිබඳ තොරතුරු වාර්තා කරනු ලබයි.

⇒ සත්‍යාශ්‍රහ, මහා රාජාධිරාජ, පරමේශ්වර වැනි විරුදනාම මෙතුමා භාවිත කර තිබේ.

⇒ තම රාජ්‍යයේ විශාලත්වය නිසා තම බාල සොහොයුරු විෂ්ණුවර්ධනට වෙංගිය මුල් කරගනිමින් නැගෙනහිර ප්‍රදේශෙ පාලනය කිරීමට පවරා ඇත. නැගෙනහිර චාලුක්‍ය වංශයක් ඇරඹෙන්නේ ඒ සමගය.

⇒ දෙවන පුලකේශීන්ගේ අවසන් කාලයේ දී පල්ලව පාලක පළමුවන මහේන්ද්‍රවර්මන් පුත් පළමුවන නරසිංහවර්මන් රජු සමග සටන් කිරීමට සිදු විය. නැගෙනහිර මනිමංගලය නම් ස්ථානයේදී කළ සටන්වලදී චාලුක්‍ය හමුදා පරාජයට පත් වූ අතර ඉන් පසු පළමුවන නරසිංහවර්මන් රජු වාතාපිය ද ආක්‍රමණය කොට දෙවන පුලකේශීන් ඝාතනය කර චාලුක්‍ය ප්‍රදේශයෙන් අත්පත් කරගත්තේය.

◊ ඒ අනුව එතැන් පටන් නරසිංහවර්මන් රජු වාතාපිකොණ්ඩ නම් විරුදය භාවිත කළ අතර මල්ලිකාර්ජු කෝවිල් ලිපියේ මේ පිළිබඳ සඳහන් වේ.

◊ මෙම සටනේදී පල්ලව රජුට සිංහල මාන නම් කුමාරයෙකු (මානවම්ම) සහය දක්වා ඇත.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය සකස් කිරීම : කේ. ගයාන් සිසිර කුමාර මයා - ශ්‍රී ලං.ගු.සේ. II - ර/එරත්න මහා විද්‍යාලය, එරත්න, කුරුවිට
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස කුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

- මේ පරාජයෙන් පසු වසර 10 පමණ කාලයක් චාලුක්‍ය වංශය අරාජිකව පැවති අතර වික්‍රමාදිත්‍ය නම් දෙවන පුලකේශීන්ගේ පුත්‍රයෙකු නරසිංහවර්මන් රජු වාතාපියෙන් පලවාහැර චාලුක්‍ය රාජ්‍ය නැවත ගොනැගීමට කයුතු කළේය. පාණ්ඩ්‍ය ආධාර ද ලබාගත් වික්‍රමාදිත්‍ය රජු නරසිංහවර්මන් රජුට එරෙහිව සටන් කොට කාංචිය ද ආක්‍රමණය කිරීමට සමත් විය.

- වික්‍රමාදිත්‍ය රජුගෙන් පසු ඔහු පුත් විනයාදිත්‍ය බලයට පත් වන අතර ඔහු දකුණේ චෝළ, පාණ්ඩ්‍ය, පල්ලව, කේරළ හා කලභ්‍ර ආදීන් පරාජයට පත් කිරීමට සමත් වී ඇත.

- විනයාදිත්‍ය රජුගෙන් පසු ඔහු පුත් විජයාදිත්‍ය බලයට පත් වන අතර මෙකල චාලුක්‍යයේ සෞභාග්‍යමත් කාලයක් ලෙස සැලකේ. මේ අවධියේ බිහි වූ පත්තදකාල්හි සංගමේශ්වර දේවස්ථානය විශිෂ්ට නිර්මාණයකි.

- විජයාදිත්‍ය ඇවෑමෙන් ඔහු පුත් දෙවන වික්‍රමාදිත්‍ය රජ වන අතර මොහු යුවරජව සිටින අවධියේ දී පල්ලව පාලක දෙවන පරමේශ්වරවර්මන් රජු පරාජය කිරීමට සමත් වී ඇත. රජවීමෙන් පසු එවකට පල්ලව පාලකයා වූ දෙවන නන්දිවර්මන් රජු පරාජය කර කාංචිය චාලුක්‍ය පාලය යටතට ගත්තේය. නමුත් පසුව නන්දිවර්මන් රජුට කාංචිය භාර දී කෛලාසනාථ දේවස්ථානයට අයත් ව තිබූ සම්පත් ද නැවත ලබා දී එම දේවාලය අසල ස්ථම්භයක එම සිදුවීම් සටහන් කොට කණ්ණඩ භාෂාවෙන් ශිලා ලිපියක් ද කරවීය. මේ අවධියේ එල්ල වූ අරාබි ආක්‍රමයණයක් ද මැඩලීමට චාලුක්‍යයන් සමත් වී ඇත.

- වික්‍රමාදිත්‍ය රජුගෙන් පසු දෙවන කීර්තවර්මන් රජු බලයට පත් වන අතර ඔහු බටහිර චාලුක්‍ය පෙළපතේ අවසන් පාලකයා වේ. මේ අවධියේ චාලුක්‍ය බලය පිරිහීමට ලක් වන අතර රාෂ්ටකූට පාලක දන්තිදුර්ග කීර්තිවර්මන් රජු පරාජයට පත් කර රාෂ්ටකූට බලය ඩෙකානයේ ස්ථාපිත කිරීමට සමත් විය.

## බටහිර චලුක්‍ය - කල්‍යාණිය

- සියවසක පමණ කාලයක් පැවති රාෂ්ටකූට බලය යටපත් කරමින් දෙවන තෛලය (ක්‍රි.ව. 973-997) විසින් කල්‍යාණිය මුල් කරගනිමින් චාලුක්‍ය බලය නැවත ගොඩනැගීමට සමත් විය.

- දෙවන තෛලගෙන් පසු බලයට පත් ඔහුගේ මුනුපුරු පළමුවන සෝමේශ්වර ක්‍රිෂ්ණා-තුංගභද්‍ර අතර වූ රායිචූර් දෙගම්මැදියේ බලය වෙනුවෙන් චෝළයන් හා ගැටුණි. කොප්පම්හි සිදුවූ සටනින් සෝමේශ්වර ජයගත්ත ද කුදල්සංගම්හීදී පරාජයට පත් විය.

- පළමුවන සෝමේශ්වර රජුගෙන් පසු ඔහු පුත් වික්‍රමාදිත්‍ය බලයට පත් වූ අතර ඔහු චෝළයන් හා සටන් කොට ජය ලැබීමට සමත් වී ඇත.

- වික්‍රමාදිත්‍ය රජුගෙන් පසු කල්‍යාණි චාලුක්‍ය බලය පිරිහීමට ලක් වූ අතර මෙම වංශයේ අවසන් පාලකයා ලෙස සැලකෙන්නේ සිව්වන සෝමේශ්වර රජුය.

අන්තර්ගතය සකස් කිරීම : කේ. ගයාන් සිසිර කුමාර මයා - ශ්‍රී ලං.ගු.සේ. II - ර/එරත්න මහා විද්‍යාලය, එරත්න, කුරුවිට
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස කුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## නැගෙනහිර චාලුක්‍ය - වෙංගිය

- දෙවන පුලකේශීන්ගේ සොයුරු පළමුවන විෂ්ණුවර්මන් රජුගෙන් මෙම වංශය ආරම්භ වූ අතර ස්වාධීනව ප්‍රබල බලයක් ගොඩනගාගත් මෙම වංශයේ ප්‍රථමයා ලෙස සැලකෙන්නේ නරේන්ද්‍ර මෘගරාජා රජුය.
- වෙංගියෙ චාලුක්‍යයෝ මුල් කාලීනව චෝළයන් සමග විරුද්ධව කටයුතු කළද පසුව චෝළයන් සමග සහයෝගයෙන් කටයුතු කළහ.
- රාජරාජ නරේන්ද්‍ර නම් චාලුක්‍ය රජු රාජේන්ද්‍ර නම් චෝළ රජුගේ අම්මංගයම්මා නැමති දියණිය විවාහ කරගත් අතර ඔවුන්ට ලැබුණු පුත්‍රයා වූ කුලෝත්තුංග කුමරු ප්‍රසිද්ධ වූයේ චාලුක්‍ය වංශිකයෙකු ලෙස නොව චෝළ වංශිකයෙකු ලෙසය.
- මේ අනුව 12 වන සියවසේ මධ්‍ය භාගය පමණ වන විට නැගෙනහිර චාලුක්‍යයන් චෝළ බලයට යටපත් වී ගියේය.

## පාණ්ඩ්‍යයෝ - මධුරාපුර

- පාණ්ඩ්‍යයන් පිළිබඳ මුල්ම තොරතුරු මහාවංසයේ සඳහන් විජය කතා පුවත හා සම්බන්ධ තොරතුරුවලින් ලැබේ. නමුත් මොවුන් පිළිබඳ සැලකිය යුතු පැහැදිලි විස්තර ලැබෙන්නේ ක්‍රි.ව. 06වන සියවසේ සිටය.
- මධුරාව අගනුවර කරගත් පාණ්ඩ්‍යයන්ගේ ප්‍රථම වැදගත් පාලකයා ලෙස සැලකෙන්නේ කඳුන්ගෝන්ය.
- කඳුන්ගෝන්ගෙන් පසු මාරවර්මන් අවනිශූලාමණි ද ඉන් පසු ශෙන්දන් ද (මොහු “වානවන්” නම් විරුදය භාවිත කොට ඇති බවයි.) බලයට පත් විය.
- ශෙන්දන්ගෙන් පසු ඔහු පුත් අරිකේසරී මාරවර්මන් බලයට පත් වූ අතර ඔහු වික්‍රමාදිත්‍ය චාලුක්‍ය රජු සමග හිතවත්ව කටයුතු කළ අතර පල්ලව පාලකයන්ට විරුද්ධව කටයුතු කළේය.
- අරිසකේසරීගෙන් පසු ඔහු පුත් කොච්චඩයියන් හෙවත් රණධීර රජ වූ අතර ඔහු අසල්වැසි රාජ්‍යයන් යටපත් කරගැනීමට උත්සාහ කළේය. ආයි නැමැත්තෙකුගේ කැරැල්ලක් පවා මර්දනය කිරීමට සමත් විය.
- රණධීරගෙන් පසු බලයට පත් ඔහු පුත් පළමුවන රාජසිංහ මාරවර්මන් (730-765) නන්දිග්‍රාම හෙවත් නන්දිපුරම් නම් ස්ථානයේදී පල්ලවයන් හා සටන් වැදුණු නමුත් ඉන් පරාජයට පත් විය. නමුත් රාජසිංහ කාවේරි නදිය තරණය කරමින් මාලකොන්ගම් රාජ්‍ය පවා ඈඳා ගැනීමට සමත් විය.
- රාජසිංහ වර්මන්ගෙන් පසු ජටිල පරාන්තක හෙවත් පළමුවන වරගුණ මහාරාජ බලයට පත් වූ අතර පාණ්ඩ්‍ය රාජ්‍ය අධිරාජ්‍ය තත්තවයට ව්‍යාප්ත කිරීමේදී ප්‍රමාණවත් කාර්යයක් ඉටුකළ තැනැත්තා ලෙස මොහු හැඳින් වේ. මොහු යටතේ පාණ්ඩ්‍ය රාජ්‍ය තංජෝර් හා කොයිම්බටෝර් ආදි ප්‍රදේශවල ව්‍යාප්ත විය.

අන්තර්ගතය සකස් කිරීම : කේ. ගයාන් සිසිර කුමාර මයා - ශ්‍රී ලං.ගු.සේ. II - ර/එරත්න මහා විද්‍යාලය, එරත්න, කුරුවිට
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස කුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

- ඔහුගෙන් පසු රාජ්‍යයත්වයට පත් වූයේ ඔහු පුත් ශ්‍රී මාර ශ්‍රී වල්ලභය (815-863) පාණ්ඩ්‍ය අධිරාජ්‍ය ඉන්දියාවෙන් බැහැරට ව්‍යාප්ත කිරීමට උත්සාහ ගත් මොහු පළමුවන සේන රජුගේ කාලයේ ශ්‍රී ලංකාව ආක්‍රමණය කොට අනුරාධපුරය කොල්ලකා ගියේය. එයට පලිගැනීමක් වශයෙන් පළමුවන සේන රජුගෙ ඇවැමෙන් රාජ්‍යත්වයට පත් දෙවන සේන රජු කුට්ඨා නම් සෙනවි යටතේ මධුරාව ආක්‍රමණය කොට ශ්‍රී මාර ශ්‍රී වල්ලභ රජු මාරා ලංකා නියෝජිතයා ලෙස වල්ලභ රජුගේ පුත් දෙවන වරගුණවර්මන් පාණ්ඩ්‍ය සිහසුනට පත් කළේය. මේ සටනේදී දෙවන වරගුණවර්මන් සිංහල රජුට ආධාර ලබා දී ඇත.

- මෙයින් පසු පාණ්ඩ්‍ය බලය බොහෝ දුරට දුර්වල වූ අතර දෙවන වරගුණවර්මන් බලය නැවත ගොඩනැගීමට උත්සාහ කළ ද අසාර්ථක විය. මොහුට පල්ලව, චෝළ හා ගංගයන්ගේ ඒකාබද්ධ ප්‍රහාරයන්ට මුහුණ දීමට සිදු වූ අතර ශ්‍රී පුරුම්බියම්හි ඇති වූ සටනින් ඔහුගේ බලය බිඳවැටිණි.

- දෙවන වරගුණවර්මන් රජුගෙන් පසු පරන්තන වීරනාරායණ බලයට පත් විය. ඔහුගේ අවධියේ පාණ්ඩ්‍ය රාජ්‍ය අභිභවා චෝළ රාජ්‍ය නැගී ආවේය.

- පරන්තන රජුට පසු රාජ්‍යයත්වයට පත් වූයේ දෙවන රාජසිංහ මාරවර්මන් රජුය. ඔහු චෝළ ආක්‍රමණයන්ට මුහුණු දීමට ශ්‍රී ලංකාවේ පස්වන කාශ්‍යප රජුගෙන් ආධාර ඉල්ලූ අතර සිංහල රජු කුට්ඨා නම් සෙනවි යටතේ ආධාර සේනා යැවූ අතර වෙල්ලූර්හීදී ඇති වූ සටනින් සිංහල-පාණ්ඩ්‍ය ඒකාබද්ධ හමුදා පළමුවන පරන්තක නම් චෝළ රජු අතින් පරාජයට පත් විය. මෙහිදී පාණ්ඩ්‍ය රජු ආරක්ෂව පතා පාණ්ඩ්‍ය රාජකකුධ භාණ්ඩ ද රැගෙන ශ්‍රී ලංකාවට පලා එන අතර එහිදී ශ්‍රී ලංකාවේ රජු වූයේ සිව්වන දප්පුලය. ඔහු රාජකකුධ භාණ්ඩ ශ්‍රී ලංකාවේ තබා කේරළයට ගියේය. මෙයින් පසු සියවස් දෙකක් පමණ පාණ්ඩ්‍ය අධිරාජ්‍ය පරිහානියට පත්ව චෝළ අධිරාජ්‍යයේ ප්‍රාන්ත රාජ්‍යයක් ලෙස පැවතිණ.

- නැවත පාණ්ඩ්‍ය රාජ්‍ය ගොනැගෙන්නේ 12 වන සියවසේදී පමණය. දෙවන පාණ්ඩ්‍ය අධිරාජ්‍ය ලෙස සැලකෙන්නේ මෙම රාජ්‍යයි. ක්‍රි.ව. 1173 දී චෝළ සිහසුන සඳහා ඇති වූ සිවිල් අරගලවල ප්‍රතිඵලය වූයේ පාණ්ඩ්‍යයන් එහි බලය ලබාගැනීමයි.

- මේ ආකාරයට පාණ්ඩ්‍ය බලය නැවත නගා සිටුවීමේ ප්‍රථම වැදගත් කාර්යය ඉටුකරන ලද්දේ ජටාවර්මන් කුලසේකර රජුය (1190-1216).

- ජටාවරමන් කුලසේකර පාණ්ඩ්‍ය රජුගෙන් පසු බලයට පත් පළමුවන මාරවර්මන් සුන්දර පාණ්ඩ්‍ය රජු චෝළ රාජ්‍යය ආක්‍රමණය කොට තංජෝර් හා උරයිඌර් නගර කොල්ලකා තම අභිෂේක මංගල්‍යය ද එහිදීම පැවැත්වීය.

- දෙවන පාණ්ඩ්‍ය අධිරාජ්‍යයේ ශ්‍රේෂ්ඨතම පාලකයා ලෙස සැලකෙන්නේ 1251 දී බලයට පත් ජටාවර්මන් සුන්දර පාණ්ඩ්‍ය රජුය. චෝළ, කේරළ පාලකයන් තමාට අවනත කරගත් මොහු ඉන්දියාවෙන් බැහැරට තම ආධිපත්‍ය ව්‍යාප්ත කළේය. ශ්‍රී ලංකාවේ දෙවන පරාක්‍රමබාහු රජුගේ ඉල්ලීම පරිදි මාඝ පලවා හැරීමට මෙතුමා ආධාර ලබා දී ඇත. අවසාන කාලයේ පල්ලවයන්ගේ කාංචිය ආක්‍රමණය කිරීමට ද මොහු සමත් විය.

copyright © www.e-thaksalawa.moe.gov.lk


Copyright © www.e-thaksalawa.moe.gov.lk

- සුන්දර පාණ්ඩ්‍ය රජුගෙන් පසු පළමුවන මාරවර්මන් කුලසේකර රජු බලයට පත් වූ අතර ඔහු යාපහුවේ පළමුවන බුවනෙකබාහු රාජ්‍ය අවධියේ ශ්‍රී ලංකාව ආක්‍රමණය කොට දන්ත ධාතුන්වහන්සේ පාණ්ඩ්‍ය දේශයට රැගෙන ගියේය. එය නැවත ගෙන්වා ගැනීමට තුන්වන පරාක්‍රමබාහු රජු සමත් විය.

- මාරවර්මන් කුලසේකර පාණ්ඩ්‍ය රජුගෙන් පසු පාණ්ඩ්‍ය රාජ්‍ය තුළ අර්බුද නිර්මාණය වූ අතර මලික්කපූර්ගේ දිල්ලි සුල්තාන් ආක්‍රමණ හේතුකොට ගෙන දෙවන පාණ්ඩ්‍ය අධිරාජ්‍යයද පරිහානියට පත් විය. මෙම මුස්ලිම් ආක්‍රමණ හේතුකොටගෙන උතුරේ මෙන්ම දකුණේ රාජ්‍යයද බිඳ වැටුණු අතර 16 වන සියවස පමණ වන විට පාණ්ඩ්‍ය රාජ්‍ය පැවති ප්‍රදේශයන්හි විජයනගර් නම් අධිරාජ්‍ය බිහි විය.

Copyright © www.e-thaksalawa.moe.gov.lk



Copyright © www.e-thaksalawa.moe.gov.lk